

'මා නිවත්ත අභික්කම' ~ නො නැවත ඉදිරියට යවු

| 59 වන කාණ්ඩය | බු.ව. 2560 නවම් මස පුරපසළොස්වක ද ව්‍ය.ව. 2017 පෙබරවාරි මස 10 වන ද | 10 වන කලබ |
|---|---|---|

# නිදහස් මිහිර

නිදහස් අදහස් දැයකට මඳහස් !
උදහස් දුරලා සිඳලයි දොම්නස්
සුවහස් සොම්නස් සුව වස්වනු වස්
නිදහස් අගසස් දැයට ම අස්වස් !

නිදහස් අදහස් නව නිමැවුම් දෙයි
සරුපස් පොහොරින් නෙක මල් පීදෙයි
ගැති දොස් හැරලා සිත නොවහල් වෙයි
නිදහස් මිහිරේ මුළු දැය පිබිදෙයි

**- අනඳ**



# බෝසත් මෛත්‍රෙය්‍ය හාමුදුරුවෝ

*දිවංගත ගත් කතුවර ඩේවිඩ් කරුණාරත්න සූරීන් විසිනි*
*මේ මසට යෙදෙන පඹුරණ මෙත්තෙය්‍ය මාහිමි සමරුව නිමිත්තෙනි.*

ජාත්‍යන්තර කීර්තියෙන් යුත් ශිෂ්‍ය සංහතියක් ඇති වුව ද සිය ගුරුදේවයාණන් ගේ විශිෂ්ට සපන්කමව පැවැති ධර්මදේශනාංශයෙහි ලා උන්වහන්සේට ගව් ගණනකින් වත් කිට්ටු විය හැකි ගෝලයකු නැතිවීම ඛේදයට කරුණකි. ඔබ වහන්සේ ගේ සම්භක්ත ශිෂ්‍යවරයාණන් වූ ගරු **නාරද** ස්ථවිරපාදයන් වහන්සේ සමස්ත ලෝකයේ කවර ජාතියක හෝ ළගන්නා පරිද්දෙන් නළව නළවා දහම් දෙසීමෙහි අති සමත් වුව ද, තේජස්වී ස්වරයෙන් හා ප්‍රතාපවත් වාග් මාලාවෙන් ප්‍රතිමණ්ඩිත වූ අභීත කේශර සිංහ නාදයක් බඳු ධර්මදේශනාවක්, අහෝ යළි කවද කාගෙන් අසා සැනැසෙන්න ද?

**පැළෑණේ** නායක මාහිමියන් වහන්සේ ගේ ගෝලයින් අතුරෙහි සුශීල භාවයෙන් හා තපෝ ගුණයෙන් බෝසත් කෙනෙකු බඳු වූ එක් උත්තමයාණ කෙනෙක් වූහ. එහෙත් සංසාරය කොට කර ගැනීමේ පරම අවංක වූ අධ්‍යාශයෙන් සර්වඥ ධවජධාරී වූ උන්වහන්සේ දැහැමි

**සිරිසඟබෝ** මහරජාණන් ගෙන් පසු සසර කළකිරී වල් වැද පසුව ශ්‍රමණ භූමියට ඇතුළු වූ එක ම සිංහලයා හැටියට සැලකිය හැකි **පඹුරණ මෙත්තෙය්‍ය** ස්වාමීන් වහන්සේ මිස සෙස්සෙක් නො වෙති.

මාතර පඹුරණ විසූ වෛද්‍යාචාර්ය **සි. ටී. අභයගුණරත්න** මහතාගේත් දැනටත් එගම වෙසෙන **අභයගුණරත්න** හාමිනේගේත් පුත් වූ මෙම යතීන්ද්‍රයන් වහන්සේ ඉංග්‍රීසි භාෂාවෙහි මෙන් ම සිංහල පාලි සංස්කෘතාදියෙහිද විශාරද ලේඛකයකු වූවාහු **අභයගුණරත්න** නමින් ලංකාවේ ප්‍රධාන ප්‍රවෘත්ති පත්‍ර කාර්යාලයක ප්‍රධාන සහකාර සංස්කාරකයා වශයෙන් නියුක්තව සිටියාහු ය. එහෙත් සිටි සැටියේ ම සසර කළකිරී වල් වැද ඉක්බිති බුරුමයට ගොස් ප්‍රවෘජ්‍යා භූමියට ඇතුළත් වන තුරු ම මේ වියත් ලේඛකයාණෝ ස්වකීය ගීතවත් බසින් සිංහල පාඨකයන් රසවත් කරමින් සිටියෝ ය.

හුදු ශ්‍රද්ධාවෙන් පැවිදි බිමට ඇතුළත් වූ මෙත්තෙය්‍ය ස්වාමීන් වහන්සේ බුරුමයෙන් බුද්ධගයාවට වැඩම කොට එතැනින් **බම්බලපිටියේ වජිරාරාමයට** පැමිණ **පැළෑණේ** අතිගරු නායක මාහිමියන් වහන්සේ ගේ අතවැසි සිසුවරයකු බවට පත්වූහ. **මාතර සාහිත්‍ය යුගය** නැමැති ග්‍රන්ථයෙහි පණ්ඩිත **මැදඋයන්ගොඩ විමලකිත්ති** ස්ථවිරපාදයන් වහන්සේ පළ කර ඇති පරිද්දෙන් ම " මේ යතිතුමා තරම් හුදු ශ්‍රද්ධාවෙන් සසුනට බැස ගත් උතුම් පුරුෂයෙකු විසි වන සියවසේ ලක්දිව නූපන්නේ ය. **මෙත්තෙය්‍ය යති තුමාගේ චරිතය කියවන විට** හැඟෙනුයේ සිරිසඟබෝ රජුගෙන් **පසුව එතුමා පමණ බෝසත් ගුණැතියකු සිංහල ජාතියේ නූපන් බවකි.**"

පුවත් පත් කලාවේදියකුව සිටි සමයේ එක්තරා සතිපතා ඉරුදින පත්‍රයකට "**සීයා**" නම් අභිධානයෙන් සැපයූ ලිපි පංතිය තරම් කරුණා රසයෙන් පරිපූර්ණ වූ සාහිත්‍ය නිබන්ධන මාලාවක් එද මෙදතුර අපට දකින්නට නො ලැබුණේ ය. කරුණාබර බසින් බණ කීමටත්, ගුරුපදේශ දීමටත් එතුමෝ උපන් පුතෙක් වූහ. පැවිදි බවට පත් වීමෙන් පසුව, සැබැවින් ම සසර කළකිරී මහණ වූ එතුමෝ අසාර වූ කුණු කයට කිසිදු විවේකයක් නො දුන්නාහු හෘදය රෝගයෙන් ඔත්පල වූහ. දිනෙන් දින හෘදය දිය වී යද්දීත් වෛද්‍ය උපදේශ නොතකා, සිල් බිඳෙති යි භීතියෙන් වෛද්‍යයන් නියම කළ ආහාර ආදිය හෝ අනුභව නො කොට උන්වහන්සේ මරණානුස්මෘතියෙන් ම සැනැසී ලෝකෝත්තර සුඛය අනුභව කරන්නට පටන් ගත්හ. අවසන් රෝග යෙන් මෙසේ ඔත්පලව මහාරෝග්‍යශාලාවේ සිටියදී උන්වහන්සේ විසින් ලියන ලද **මෙත් සිලිලාර, අමා ආර, හෙළ බස** ආදී ග්‍රන්ථයන් ගෙන් උන්වහන්සේ ගේ චිත්තාභ්‍යන්තරය මැනැවින් අනාවරණය වන්නේ ය. **අමා ආරෙහි** එන එක් පද්‍යාවලියක් මෙසේ ය.

"සුඛා තෙ ඣායා"
    යනුවෙන් '**බුදු තාත්තේ**
**මට ඔබ වහන්සෙගෙ**
    **සෙවණැල්ල සැප දෙනවා**

ඉති උදන් අනමින්
    දෑවැද්දක් ඉල්ලමින්
නොහිම් සොම්නස් නෙන්
    අප බුදු පියාණන් හා

නිවන් පුර වැඩි ඒ
　　සුරතල් රහල් කුමරුන්
මෙන් අපිත් අපගේ
　　සම්බුදු පියාණන් ගේ

ඇඟිල්ලේ එල්ලී
　　නිවන් පුර යමු සතුටින්
ඇඟිල්ලේ එල්ලී
　　**නිවන් පුර යමු සතුටින්!**

'**මෙත් සිලිලාර**' නම් සිසිල් සිලිලාරයෙන් ඇද හැළුණු අමා දහරක් මෙසේ ය.

"තොරඹුරේ බැරිය පන්සල් යා　　ගන්න
හාමතේ බැරිය බණ තේරුම්　　ගන්න
ඔත්පලේ බැරිය ගුණදම් රැක　　ගන්න
**මගෙ පුතේ ලොවට හැම සෙත සල　　සන්න**

සඳුන් වෙනෙන් එන සුළඟක් වැනි　　වෙම්වා
සමන් වෙනෙන් එන සුළඟක් වැනි　　වෙම්වා
සඳින් වැහෙන සොමි අමරැස් වැනි　　වෙම්වා
**මෙතින් සතුන් හට මම අම්මා　　වෙම්වා!"**

බලවත් ලෙස රෝගාතුරව සිට ගෙනත් ජීවිතය ආරක්ෂා කර ගැනීමට පවා විනය නීතියක ඉස්පිල්ලක් පාපිල්ලක් වෙනස් කරන්නට නැතහොත් පිටුපා ක්‍රියා කරන්නට අකමැති වූ සිල්වත් ගුණවත් බෝසත් මෙත්තෙය්‍ය යතිතුමාණෝ රසවතුන් දුක් සයුරක හොවා පරලෝ සැපත් වූහ.

"**බෞද්ධ ළමයා**" සඟරාවත්, එහි ම ඉංග්‍රීසි සමකාලිකයා වූ "**බෝසත්**" සඟරාවත් පැවැත්වීමෙහි ලා **පැළෑණේ ශ්‍රී වජ්‍රඥාන** නායක මාහිමියන් වහන්සේ ගේ හා පූජ්‍ය **නාරද** හිමිපාණන් වහන්සේගේත් දකුණතව දවසැරි මේ යති උතුමාණන් ගේ අභාවය බෞද්ධ ලෝකයාට බලවත් පාඩුවක් වූ බව අමුතුවෙන් කිය යුතු නොවේ. **මෙත්තෙය්‍ය** යතිතුමන් ගේ අභාවය සම්බන්ධයෙන් **පැළෑණේ** නා හිමියන් ම දුක් වූ වාර අනන්ත ය. එක් දවසක්, එවකට "**සිංහල බෞද්ධයා**" පත්‍රයේ කර්තෘ පදවිය දැරූ මෙම ග්‍රන්ථයේ කර්තෘ "**බුදුරැස් විහිදේවා!**" යන මැයෙන් වෙසක් කතු වැකියක් ලියා ගෙන ගොස් පැළෑණේ නායක මාහිමියන් වහන්සේ ඉදිරියෙහි කියැවූ වේලේ,

"**මෙත්තෙය්‍ය ගෙන් පසු බුදු ගුණයක් ඇසුවා යැ!**" යි මහානායක මාහිමියන් වහන්සේ කඳුළු බර වූ දෙනෙතින් මා දෙස බැලූ බැල්මෙන්, ස්වකීය අතවැසි **මෙත්තෙය්‍ය** යතිඳුණන් පිළිබඳව උන්වහන්සේ ගේ හදවත ඇතුළත රඟ දුන් හැඟුම් නිරායාසයෙන් ම අවබෝධ විය.

එබඳු ගෝලයකු තැනූ එකම පින, පැළෑණේ නායක මාහිමියන් වහන්සේට සගමොක් සඳහා ප්‍රමාණ යැයි සිතමු.

***(කතුවරයාගේ "ශ්‍රී වජ්‍රඥාන චරිතය" කෘතියෙනි)***





# ළමා පෙළට භාවනාව - 05

*පූජ්‍යපාද ගම්පහ පාසාදික ස්වාමීන් වහන්සේ විසිනි*

පින්වත් පුතේ දුවේ,

අද නවම් පුර පසළොස්වක පෝය දවසනෙ. ඒ නිසා අපේ පින්වත් පුතාල දුවල අද උපෝසථ සීලය සමාදන් වෙන්න ඇති නේද? සමහරක් පින්වත් පුතාල දුවල නම් මේ ලිපිය කියවන්නෙත් උපෝසථ සීලය සමාදන් වෙලාම වෙන්නත් පුළුවන්. කොහොම වුණත් පින්වත් පුතේ දුවේ, පුර පසළොස්වක පෝය දවසට උපෝසථ අෂ්ටාංග සීලය නම් රකින්නම ඕනෑ. සම්බුදු රජාණන් වහන්සේ නමකගෙ උතුම් බුදු සසුනක් තුළ පමණම යි අපට අවබෝධයෙන් ම සිල්වත් ජීවිතයක් ගත කරන්න ලැබෙන්නෙ.

පෝය දවසට උපෝසථ සීලය රැකීම තුළින් ජීවිතයට එකතු වෙන පින පුංචි පිනක් නම් නෙවෙයි. මරණින් පසුව ඉහළ ම දිව්‍ය ලෝකයක ඉපදිලා ඉහළම දිව්‍ය සැප ලබන්න තරම් ඒ පින බලවත් එකක්. උපෝසථ සීලය රැකපු කෙනෙක් ඒ පුණ්‍ය බලයේ මහිමයෙන් දිව්‍ය ලෝකයක ඉපදිලා විඳින සැපතයි, මනුෂ්‍ය ලෝකයේ රජ

කෙනෙකු විඳින රජ සැපතයි සංසන්දනය කළොත්, මනුෂ්‍ය ලොකයේ රජ සැපය ඉතා දිළිඳු සැපතක් හැටියයි අපේ භාග්‍යවත් සම්බුදු රජාණන් වහන්සේ මහා කරුණාවෙන් අපට දේශනා කොට වදාළේ.

පින්වත් පුතේ දුවේ,

උපෝසථ සීලය රැකීමේ ආනිසංස මරණින් පසුව ම ලැබෙන දෙයක් නෙවෙයි. මේ ජීවිතයේදිමත් අපට ලැබෙනව. උපෝසථ සීලය රකින කොට සිතත් රැකෙනවා. සිත රැකෙන කොට සිතින් කයින් වචනයෙන් වැරදි වෙන්නෙම නෑ. වැරදි වෙන්නෙ නැති නිසා පව් රැස් වෙන්නෙ නෑ. පව් රැස් වෙන්නෙ නැති නිසා සිත පිරිසිදුයි. සිත පිරිසිදු නිසා ජීවිතයට එකතු වෙන්නෙ පින් විතරමයි. පින බලවත් වෙනකොට අපේ මතක ශක්තිය වැඩෙනව. අධ්‍යාපන කටයුතු දියුණු වෙනව. හොඳ දේවල් පමණක් ම කරන්න සිත පෙළඹෙනව. නරක නොමනා දේවල්වලින් දුරස් වෙලා යනව. භාවනා කළොත් හිත දියුණු වෙනව. කාගෙත් අවධානයට යොමු වෙන, ආදරය ලැබෙන ප්‍රියශීලි කෙනෙකු වෙනව. දෙවිවරුන්ගෙන් පවා ආශීර්වාදය ආරක්ෂාව ලැබෙන වාසනාවන්ත කෙනෙකු වෙනව.

බලන්නකො පින්වත් පුතේ දුවේ, මේ මිනිස් ලෝකයේ මාසෙකට දවසක් උපෝසථ සීලය රැකීමෙන් අපට සිද්ධ වෙන යහපත. ඒ නිසා අපේ පින්වත් පුතාල දූලා පුළුවන් තරම් උත්සාහ කරන්න හඳ පිරෙන සෑම පුර පසළොස්වක පෝය දවසකම උපෝසථ අෂ්ටාංග සීලය සමාදන් වෙලා රැකගන්න.

පින්වත් පුතේ දුවේ,

අපි ගිය මාසෙත් අපේ භාග්‍යවත් සම්බුදු රජාණන් වහන්සේ ගැන පින්වත් පුතාල දූලා දැනුවත් කළානෙ. පුංචි කාලෙ ඉඳල ම අප පුළුවන් තරම් අපේ බුදු රජාණන් වහන්සේ පිළිබඳ ව පැහැදීම ඇති කරගන්න ඕනෑ. බුදු කෙනෙකු මේ ලෝකයට පහළ වෙන්නේ අප නිසාමනේ. අප සරණ ගිය අපේ භාග්‍යවත් සම්බුදු රජාණන් වහන්සේට දීපංකර බුද්ධ ශාසනයේ දී ඉතා පහසුවෙන් නිවන් අවබෝධ කරගන්න තිබුණනෙ. ඒත් ඒ අවස්ථාව මගහැරල සාරාසංඛෙය්‍ය කල්ප ලක්‍ෂයක් අප වෙනුවෙන් ම සංසාරෙ දුක් වින්දනෙ. ඒ නිසා පින්වත් පුතේ දුවේ, අප වෙනුවෙන් මේ සංසාරෙ බොහෝ දුක් විඳල සම්බුදු බවට පත්වෙච්ච ගෞතම බුදු සමිඳුන් කෙරෙහි ගෞරවනීය පැහැදීමක් ඇති කරගන්න ඕනෑ. ඒකට තමයි ශ්‍රද්ධාව කියන්නෙත්. ඒ ශ්‍රද්ධාව තමයි අපි මේ සංසාර දුකෙන් නිදහස් කරවන්නෙ.

පින්වත් පුතේ දුවේ,

සමහරක් මිනිසුනට තේරුම් ගන්න බැරි වුණ බුදු ගුණය හිත්පිත් නැති කළුගල් වලට තේරුණානේ. දවසක් දේවදත්ත කියන ශ්‍රද්ධාව නැති හාමුදුරුවො අපේ බුදු රජාණන් වහන්සේව ඝාතනය කරල බුදු වෙනව කියල මෝඩ විදිහට කල්පනා කරල අජාතසත්ත රජ්ජුරුවන්ගෙන් උදව් ඉල්ලුවා. අජාතසත්ත රජතුමාගෙන් සහය ලබාගත්ත දේවදත්ත හාමුදුරුවො බුදු රජාණන් වහනසේව ඝාතනය කරන්න එක් සෙබළෙකු පිටත් කළා. ඒ සෙබළව මරන්න තවත් සෙබළුන් දෙදෙනෙකු පිටත් කළා. ඒ දෙන්නා

මරන්න තවත් සෙබළුන් හතර දෙනෙකුත්, ඒ හතර දෙනා මරන්න තවත් සෙබළුන් අට දෙනෙකුත්, ඒ අට දෙනා මරන්න තවත් සෙබළුන් දහසය දෙනෙකුත් පිටත් කළා.

පින්වත් පුතේ දුවේ,

මුල්න් ම ගිය සෙබළා බුදු රජාණන් වහන්සේ වැඩ හිටිය ගස් සෙවණට කිට්ටු වෙනකොට ලොකු බයකින් වෙව්ලන්න පටන් ගත්තා. තමන් වහන්සේ සිටින තැනට නුදුරෙන් ම බයෙන් වෙව්ලමින් සිටින මේ සෙබළාට බුදු රජාණන් වහන්සේ කථා කරල වෙව්ලන්නේ ඇයි කියලා විමසුව ම මේ සෙබළා තමන් පැමිණි කරුණ හෙළි කළා. මේ සෙබළාට අපේ බුදු රජාණන් වහන්සේ මහා කරුණාවෙන් ධර්මය දේශනා කළා. ධර්ම දේශනාව අවසානයේ දී මේ සෙබළා සෝවාන් වුණා. ඔහු පැමිණි මාර්ගයේ ම ආපසු ගියොත් ඔහුට අත්වෙන ශෝචනීය ඉරණම අපේ සම්බුදු රජාණන් වහන්සේ දිවැසින් දැකල මේ සෙබළව වෙනත් මාර්ගයකින් පිටත් කළා. මොහුගේ පැමිණීමේ ප්‍රමාදය නිසා මොහුව ඝාතනය කිරීමට සූදනම් ව සිටි අනිත් සෙබළුන් දෙදෙනා මොහුව සොයා පැමිණෙද්දී බුදු රජාණන් වහන්සේ ගස් සෙවණක වැඩ හිඳිනවා දැක එතැනට පැමිණ පුද්ගලයකු මාර්ගයේ ගමන් කරනවාදැයි විමසා සිටියා.

පින්වත් පුතේ දුවේ,

අපේ භාග්‍යවත් සම්බුදු රජාණන් වහන්සේ මේ පුද්ගලයන්ගෙන් කවර කරුණක් නිසා සොයනවා දැයි විමසා සිටිය විට මේ දෙදෙනා තමන් පැමිණි කරුණ

හෙළි කළා. එවිට අපේ බුදු රජාණන් වහන්සේ මහා කරුණාවෙන් මේ දෙදෙනාට ද ධර්මය දේශනා කළ විට ඉතා ඕනෑකමින් බණ ඇසූ මේ දෙදෙනා ද සෝවාන් වුණා. බුදු සමිඳුන්ට ගෞරවයෙන් වන්දනා කරලා ආපසු පිටත් වන්නට සූදනම් වන විට පැමිණි මාර්ගයේ ම ගමන් කළ විට සිදුවන බිහිසුණු ඉරණම දිවැසින් දුටු අපේ බුදු සමිඳුන් මේ දෙදෙනා ද වෙනත් මාර්ගයකින් පිටත් කර හැරියා.

පින්වත් පුතේ දුවේ,

ඊට පස්සේ මේ දෙදෙනාගේ ප්‍රමාදය නිසා මොවුන් දෙදෙනා ඝාතනය කිරීමට සූදනමින් සිටි අනිත් හතර දෙනා ද මාර්ගයේ ඉදිරියට පැමිණි විට රුක් සෙවණේ විවේකයෙන් වැඩ සිටි අපේ සම්බුදු රජාණන් වහන්සේව යි හමුවුණේ. මේ ආකාරයට මේ හතර දෙනා ඝාතනය කිරීමට පැමිණි අනෙක් අට දෙනාටත්, ඒ අට දෙනා ඝාතනය කිරීමට සිටි අනෙක් දහසය දෙනාටත් බුදු රජාණන් වහන්සේ මුණ ගැසීමෙන් ඉතා ඕනෑකමින් බණ ඇසූ නිසාම සෝවාන් ඵලයට පත්වුණා.

මිනීමරුවන් තිස් දෙනෙක් බිහි වන්නටත්, මනුෂ්‍ය ඝාතන පහළොවක් සිදුවන්නටත් ගිය අතිශය බිහිසුණු මිලේච්ඡ ඝාතන සැලැස්ම අපගේ භාග්‍යවත් මහා කාරුණික බුදු රජාණන් වහන්සේ නිසා ම නතර වුණා. දරුණු දුක් විපාක විඳින්න සිද්ධ වෙන බලවත් අකුසල කර්ම රැස් කරගන්න ගිය අසරණ මිනිසුන්ට අපේ සම්බුදු රජාණන් වහන්සේ නිසා ලැබුණු පිළිසරණ පුදුම සහගතයි. මේ වගේ සාහසික ක්‍රියාවක් කරන්න ඉදිරිපත් වුණත් ඒ හැමෝගෙම ජීවිතවල මාර්ගඵල ලබන්න තරම් පිනක් මෝරලා තිබුණානෙ.

අපේ පින්වත් පුතාල දූලටත් සමහරක් වෙලාවට මේ ජීවිතයේ දී ම සෝවාන් වෙන්න පින් ඇති. ඒ නිසා පුංචි වැරදි වැඩක්වත් නොකර හොඳ පුතාල දුවල වෙන්න හැමෝම උනන්දු වෙන්න.

ඉතින් පින්වත් පුතේ දුවේ, අපේ බුදු රජාණන් වහන්සේ ඝාතනය කරන්න ආ පළමුවැනි සෙබළනෙ පළමුවෙන් ම සෝවන් වුණේ. බුදු රජාණන් වහන්සේ පෙන්නපු මාර්ග යේ මේ සෙබළා පිටත් වෙලා කෙළින් ම ගියේ රාජ මාලිග ාවටයි. එහි දී දේවදත්ත කියන පව්කාර හාමුදුරුවො මෙයාට මුණ ගැහුණා. මේ සෙබළා තමන් මුහුණ දීපු සිදුවීම දේවදත්ත හාමුදුරුවන්ට කිව්වා. ඒ වෙලාවේ දේවදත්ත හාමුදුරුවො තමන් ම බුදු රජාණන් වහන්සේව ඝාතනය කරන්න අදහස් කර ගත්තා.

පින්වත් පුතේ දුවේ,

දවසක් අපගේ භාග්‍යවත් සම්බුදු රජාණන් වහන්සේ ගිජුකුළු පව්ව මුදුනෙ ඉදිරිපස විවේකයෙන් සක්මන් කරමින් සිටින මොහොතක දේවදත්ත හාමුදුරුවො ගල් පව්වකට නැගල තරමක් ලොකු ගලක් අපේ බුදු රජාණන් වහන්සේ ඉලක්ක කරගෙන ඝාතනය කිරීමේ අදහසින් අතහැරියා. ගල පහළට වැටෙනවත් සමඟ හිත්පිත් නැති ගල් පව්වෙන් පතුරු දෙකක් මතු වී අර ගල පහළට වැටෙන්න නොදී රැක ගත්තා. ගල් පතුරු දෙකේ ගල ගැටීමෙන් කැඩී ගිය කුඩා ගල් පතුරක් සම්බුදු සිරි පතුලේ හැපී අපේ සම්බුදු රජාණන් වහන්සේගේ ශ්‍රී රුධිරය ගලා ගියා. එසැණින් ම දේවදත්ත හිමියන්ට ආනන්තරිය පාප කර්මය ද සිදු වුණා.

සමහරක් පච්කාර මිනිසුන්ට සම්බුදු සිතක අසිරිය නොතේරුණාට, සම්බුදු ගුණයේ මහිමය නොදැනුණාට හිත් පිත් නැති කළු ගල්වලටත් දැනුණනෙ. ඒ තරමට ම බුදුගුණ ප්‍රබලයි. මහ පොළොවටත් ඉසිලිය නොහැකි ගුණ කඳක් දරාගෙනයි අපේ භාග්‍යවත් සම්බුදු රජාණන් වහන්සේ වැඩ සිටියේ. හිත්පිත් නැති මහ කළු ගල් පර්වත වලටත් දැනෙන අසිරිමත් ගුණ ඇති ශාස්තෘන් වහන්සේ නමක් වන, මේ මහා පොළොවටත් උසුලා ගත නොහැකි විස්මිත ගුණ කඳක් ඇති ශාස්තෘන් වහන්සේ නමක් වන, ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේ අපට සරණ යන්න ලැබීම මොන තරම් නම් වාසනාවක් ද? අපි තරම් වාසනාවන්ත පිරිසක් මේ මිනිස් ලෝකයේ කොහේවත් නැහැ. ඒ නිසා පින්වත් පුතේ දුවේ, අපි හැම වෙලේ ම අපේ බුදු රජාණන් වහන්සේව හැම මොහොතක ම ගෞරවයෙන් සිහි කරමු. ගෞරවයෙන් වන්දනා කරමු.

පින්වත් පුතේ දුවේ,

ලෝකයට කලාතුරකින් පහළ වන සම්බුදු රජාණන් වහන්සේ නමකගේ අසිරිමත් සම්බුදු ගුණ සිහිකොට හිතේ ශ්‍රද්ධාව උපදවා ගැනීමට අපි ඊළඟ හඳ පිරුණු පෝය දවසෙදිත් මුණගැහෙමු. එතෙක් පින්වත් පුතුට දුවට උතුම් තෙරුවන් සරණයි.





# හොඳ ළමයි

*ඇමෙරිකාවේ හාවඩ් සරසවියේ*
*පූජ්‍ය දෑරංගල කුසලඥාණ හිමිපාණන් විසිනි*

ඉර ඇහැරෙන්නෙත් අප හින්දයි
හඳ පායන්නෙත් අප හින්දයි
මල් පිබිදෙන්නෙත් අප හින්දයි
හොඳ ළමයින් හින්දයි

හා පැටවුන් මෙන් සුදු පාටයි
මානෙල් මල් මෙන් සුවඳ හමයි
මී කිරි වාගේ හිනා කටයි
දහම් පාසලට උදෙන්ම යයි

හරි සුදු පාටයි කිරි සයුරයි
සිල් සුවඳයි මල් පාට ගොඩයි
රටා මැවුණු පන් පැදුරක් වාගෙයි
බෝ මළුවට මං හරි ආසයි

පුංචි පුංචි අඩි බිම තියලා
සංසුන් ගමනට බර දීලා
අඩවන් වූ නෙත බිමට හෙළා
පොඩි හාමුදුරුවො වැඩම කළා

පේළි පේළි අපි පෙළ ගැසෙමු
අත් දෙක නළලේ තබා ගමු
නමස්කාර පාඨය කියමු
සාදු කියා පන්සිල් ගනිමු

සතුන්ට හිංසා නොකරමි කියලා
අනුන්ගේ දේවල් නොගනිමි කියලා
කම් මිසහසරින් සිත මුදවාලා
බොරුවෙන් මත් වතුරෙන් ගැලවීලා

බුදුගුණ දම් ගුණ සඟ ගුණ වඳිමී
හඳුන්කුරු මම් පහනින් පුදමී
සාධු සිතින් ගුරු උපදෙස් පතමී
දහම් උගනිමින් ගුණදම් වඩමී

ගුණවත් දරුවන් බිහි කරන
බම්බලපිටියේ මිණි පහන
වජිරාරාමය දම් සෙවණ
පින් තොට අපගේ හිත හදන



# බෞද්ධ වත් පිළිවෙත්

*කොළඹ විශ්ව විද්‍යාලයේ හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යාණී*

*ශාස්ත්‍රපති සුධර්මා පණ්ඩිත මහාත්මනිය විසිනි*

'වත්තං න පරිපූරෙන්තො න සීලං පරිපූරති' යන බුදු වදනට අනුව විමුක්ති මාර්ගයේ පළමුවැනි ප්‍රතිපදාව සීලස්කන්ධය සම්පූර්ණ කර ගැනීමට නම් වත් පිළිවෙත් පළමුවෙන් ම හඳුනාගෙන ඒවා අනුව තම ජීවිතය සකස් කර ගැනීමට උත්සුක විය යුතුයි. දෛනික ජීවිතයේ දී වත් පිළිවෙත්වල නිරතවීමෙන් ඒ තැනැත්තා නිරායාසයෙන් ම හොඳ ශික්ෂණයක් ලබයි. අභ්‍යන්තරය මෛත්‍රී කරුණාවෙන් යුක්ත වන අතර බාහිර ඇවතුම් පැවතුම් ද සංවරශීලී වෙයි.

දවස ආරම්භයේ දී ම තමා අයත් කටයුතු ටික පිරිසිදුව පිළිවෙළට අනෙක් අයට කරදරයක් නොවන සේ කළ යුතු ය. මුහුණ, අතපය සෝදා ගැනීමට තමා පාවිච්චි කරන නාන කාමරය ඉතා පිරිසිදුව පිළිවෙළකට තබා ගත යුතු ය. තමා නිසා නාන කාමරය අපවිත්‍ර වුවහොත් එය අනෙකකු ලවා ශුද්ධ කරන්නට නො තබා තමා

විසින් ම පිරිසිදු කර ගත යුතු ය. තමන් පාවිච්චි කරන සබන්, දත් බුරුසු, තුවා ආදී දේවල් හැම තැන ම නො විසුරුවා නියම තැන තබා ඊළඟට පාවිච්චි කරන්නට එන තැනැත්තාට කරදරයක් නොවන සේ තැන්පත් කළ යුතු ය. මෙයින් පරාර්ථකාමී ගුණය නිතැතින්ම තමා තුළ වැඩේ.

දස පුණ්‍ය ක්‍රියාවල එන '**වෙය්‍යාවච්ච**' යන පුණ්‍ය කර්මයෙන් අදහස් වන්නේ ද වත් පිළිවෙත් කිරීම පින් වැඩෙන ක්‍රියාවක් වශයෙන් ය. බුද්ධෝපස්ථාන පින මහත් ආනිසංස දායක ක්‍රියාවකි. තම තමන්ගේ නිවෙස්වල බුදු කුටියක් සාදාගෙන උදේ සවස මල් පහන් සුවඳ දුම්, බෙහෙත් ගිලන්පස, ආහාර ආදිය පිදීමෙන් තමන්ට දෙව් රැකවරණයක් ලැබේ. ඉරු දින පන්සලට ගිය විටත් බෝ මළුව අතුගෑම, මල් ආසනවල තියෙන පරමල් ඉවත් කර මල් ආසන සේදීම, පහන් පත්තු කරන විට, පහන්වල තිබෙන දැලි කුණු රෙදි කැබැල්ලකින් ඉවත් කොට පහන් පත්තු කිරීම ආදී වතාවත් කිරීමෙන් තම තමන්ගේ සන්තානයන් පිරිසිදු වන අතර 'වෙය්‍යාවච්ච' නම් පුණ්‍ය කර්මයත් සිදුවේ.

විනය පිටකයේ චුල්ලවග්ග පාළියේ බුදු රජාණන් වහන්සේ භික්ෂු - භික්ෂුණීන් වහන්සේලාට අනුදැන වදාරා ඇති සේනාසන වත, භත්තග්ග වත ආදී වත් පිළිවෙත් ගිහියන්ට ද ඉතාමත් ප්‍රයෝජනවත් ය. ආවාසය පිරිසිදු කරන ආකාරය, බඩුමුට්ටු පවිත්‍ර කළ යුතු සැටි මනාව දේශනා කොට ඇත. ආවාසයේ තිබෙන බඩු මුට්ටු පවිත්‍ර

කරන විට ඒවා දොර කවුළුවල නො ගාවමින් නො ගටමින් එළියට අරගෙන සුද්ධ පවිත්‍ර කොට ඒ බඩු තිබිය යුතු තැන ම තබන ලෙස වදාරා ඇත. බිත්තිවල මකුළු දැල් තිබේ නම්, ඒවා මකුළුවාට හානියක් නොවන ලෙස ඉහළ සිට පහළට කඩා දමන සැටි ද දේශනා කොට ඇත. බිත්තියේ කුණු පැල්ලම් තිබේ නම් ඒවා රෙදි කැබැල්ලක් තෙමා මිරිකා ඒ කුණු පැල්ලම් තිබෙන තැන් පිස දැමිය යුතු ය. බිම නිතර ම අතුගා කුණු ඉවත් කළ යුතු බව දක්වා ඇත. මේ වත් පිළිවෙත් සාමාන්‍ය ගිහි ජීවිත ගත කරන අයට ද ඉතාමත් ප්‍රයෝජනවත් ය. සිත එකඟ කර ගැනීමට මේ වත් පිළිවෙත් බෙහෙවින් උපකාර වේ.

ආයු, වර්ණ, සැප, බල ආදිය ලබන්නට ගිහි පැවිදි සැමදෙනා ම කැමතියි. මේවා ලබා ගැනීමට විවිධ ආහාර පාන, බෙහෙත් ජාති පරිභෝග කිරීමට ද, රූප ලාවන්‍යාගාරවල පිහිට පතන්නට අද සමාජයේ බොහෝ දෙනා පුරුදු වී ඇත. වැඩිහිටි ගෞරවය දැක්වීමෙන් මේ සියල්ල ලබා ගත හැකි බව **'අභිවාදන සීලිස්ස නිච්චං වුද්ධාපචායිනො'** යන ගාථාවෙන් අපට පැහැදිලි වේ. විනය පිටකයේ දක්වා ඇති උපාධ්‍යාය, ආචරිය වත් සහ සද්ධිවිහාරික, අන්තෙවාසික වත්වලින් ද වැඩිහිටි ගෞරවය දැක්වීමේ වටිනාකම පැහැදිලි වේ. තම ගුරු ස්වාමීන් වහන්සේලාට අවශ්‍ය දේ සම්පාදනය කොට, කැඳ ආදිය ඇත් නම් පූජා කොට, කැඳ බීවාට පසු පැන් දී කැඳ බීපු භාජනය පිළිගෙන පහත් කොට කිසි දෙයක නො ගටමින් සෝද තැන්පත් කළ යුතු ය. එය විනය

පිටකයේ වත්තක්ඛන්ධයෙහි සඳහන් වී ඇත්තේ මෙසේ ය. '**නීචං කත්වා සාධුකං අපරිසංසන්තෙන ධොවිත්වා පටිසාමෙතබ්බං**'

ගමනක් යන විට ගුරු ස්වාමීන් වහන්සේට ඉතා ඈත්ව හෝ ඉතා ළඟ නො යා යුතු ය. දෛනික වැඩ කටයුතු කිරීමේ දී ඉතා යටහත් පහත්ව වැඩිහිටි ගෞරවය ඇතිවන සේ කළ යුතු බව මෙයින් පැහැදිලි වේ. ආචාරිය, උපාධ්‍යායන් වහන්සේලා කථා කරද්දී සද්ධිවිහාරික, අන්තේවාසික ස්වාමීන් වහන්සේලා අතරතුර කතා නොකළ යුතු බව ද දක්වා ඇත. මෙසේ කිරීමෙන් නිරායාසයෙන් ම අප තුළ වැඩිහිටි ගෞරවය එක්කම අනතිමානී ගුණය ද වැඩි දියුණුවට පත් වේ. දස පුණ්‍ය ක්‍රියා අතරින් 'අපචායන' යන පුණ්‍ය කර්මය ද වැඩේ. එසේ ම මහා මංගල සූත්‍රයේ එන '**ගාරවො ච නිවාතො ච**' යන ගුණාංග දෙක ද තම චිත්ත සන්තානයෙහි වර්ධනය වේ.

බුදු දහම අනුපූර්ව ප්‍රතිපදාවකි. දෛනිකව තමා කරන වැඩ කටයුතුවල දී බෞද්ධ වත් පිළිවෙත් අනුගමනය කිරීමෙන් සීල ප්‍රතිපදාව සම්පූර්ණ කර ගනිමින් සමාධි, ප්‍රඥා ප්‍රතිපදාවන් සමථ විපස්සනා භාවනා මඟින් වැඩි දියුණු කරගෙන අපට මාර්ග ඵල පිළිවෙලින් නිර්වාණය සාක්ෂාත් කර ගත හැකි ය.





# දිවිය හැඩ ගසා ගන්නට උපදෙස්

*"මුතු සීයා" විසිනි*

ආදරණීය දුවේ! පුතේ!

මට මතකයි මගේ වයස අවුරුදු අටේ දී පමණ අපේ පැළැණේ මහානායක හාමුදුරුවන් බෞද්ධ ළමයා සඟරාවට සැපයූ කුලු ළමයි සහ පෙණේර ළමයි යන මාතෘකාව යටතේ ලිපියක් කියෙවූ බව. නායක ස්වාමීන් වහන්සේ එයින් අපට උපදෙස් දුන්නේ අප චරිතයට නොගැළපෙන දේ ඉවත් කරලා කුල්ල වගේ හොඳ දේ පමණක් රැස් කර ගන්නට; රැක ගන්නට.

නියම බුදුනුවකු වන්නටත් සතුන් මැරීම ආදී පව් පහකින් අප වැළකිය යුතුයි. මා මෙම ලිපියෙන් අදහස් කරනුයේ ජීවිතය සාර්ථක කර ගන්නට ආදර්ශවත් කර ගන්නට නම් අප වැළකිය යුතු කරුණු කිහිපයක් මතක් කර දීමටයි. කා හට වුව මෙම වාරණ මාලාව ගැළපෙනවා; යෝග්‍ය වෙනවා.

1. වයසින් හෝ හැසිරීමෙන් හෝ ඔබට නොගැළපෙන පුද්ගලයන් ඇසුරු කරන්න එපා.
2. ඔබට ප්‍රශ්නයක් මතු වූ විට එයින් පැන යන්න එපා. කලබල වන්න ද එපා. අපහසුවෙන් වුව ද එයට මුහුණ දෙන්න. එයින් යමක් ඉගෙන ගන්න.

3. තම අවශ්‍යතාවන් කල් දමන්න එපා. අන් අයට උදවු කරන්නට තම අවශ්‍යතාවන් අමතක කරන්නට හෝ කල් දමන්නට හෝ එපා. හැමවිට ම තමා ගේ අවශ්‍යතාවන් ම වැදගත් බව සිහියේ තබා ගන්න.
4. අන්‍යයන් ගේ වැරදි හෝ අන්‍යයන් කළ නොකළ දේ ගැන සොයන්න එපා. තමා කළ නොකළ දෑ පමණක් ම සිහිපත් කරන්න.
5. අන්‍යයනට සමාන වන්නට වැර දරන්න එපා. ඔබ ඔබ ම වන්න.
6. හණ මිටිය කර ගහ ගෙන ගිය මිනිසා වගේ අතීතය බදා ගෙන ම ඉන්න එපා.
7. තමන් ගෙන් අත් වැරදි සිදු වූ විට බිය වන්න එපා. යමක් කිරීමේ දී වැරදීම මනුෂ්‍ය ගතියකි.
8. තමා ගේ වැරදිවලට දොස් පවරමින් අකම්පාල වන්න එපා. ඒවා අනාගතය සකස් කර ගන්නට ආධාර වේවි.
9. සතුට මිළ දී ගන්න සූදානම් වන්න එපා. ආදරය හා සිනහව අපට ලැබෙන්නේ නොමිළයේ ය.
10. සතුට ලබා ගැනීමට අන් අය කෙරෙහි අපෙක්‍ෂාවන් තබා ගන්න ද එපා.
11. ඔබ යමකට සූදානම් නැතැයි බිය වන්න එපා. කවරෙකු වත් සියයට සියයක් සූදානම් නැත.
12. අන්‍ය සැම දෙනා සමග ම තරග කරන්න යන්න එපා. ඔබට වඩා දක්‍ෂ අය කොතෙකුත් සිටිය හැකි ය.
13. අන්‍යයන් කෙරෙහි ඊර්ෂ්‍යා කරන්න ද එපා.
14. අලස ව කුසීත ව සිටින්න එපා.

තෙරුවන් සරණයි !



# විශිෂ්ට දයකපතියකු ගේ නික්ම යෑම



බම්බලපිටියේ සිරි වජිරාරාමයේත් මහරගම සිරි වජිරඤාණ ධර්මායතනයේත් පැරැණි දයක පවුලකට අයත් ව, සිරි වජිරාරාම දහම් පාසලේ ආදි ශිෂ්‍යයකු හා පසු කල එහි ඉංග්‍රීසි අධ්‍යයන අංශය භාර ආචාර්යවරයා වශයෙන් ද ක්‍රියා කොට, වසර 50 කට අධික කාලයක් මහරගම සාසන සේවක සමිතියේ ජ්‍යෙෂ්ඨ කාරක සභිකයකු වශයෙන් ද, සිරි වජිරාරාම කාර්යසාධක සමිතියේ ගිහි අනුශාසකවරයා වශයෙන් ද, කොළඹ 07, නාරද බෞද්ධ ධර්මායතනයේ කොළඹ සාසන සේවක සමිතියේ වසර 25 කට අධික කාලයක් ගරු සභාපතිවරයා වශයෙන් ද මාහැඟි ශාසනහිතෛෂී සේවාවක් සිදු කළ වින්ග් කමාන්ඩර් නොයෙල් ප්‍රනාන්දු මහතාණන් ගේ වියොව 'බෞද්ධ ළමයා' සටහන් කරන්නේ සාතිශය සංවේගයෙන් යුතු ව ය.

දෙහිවල විසූ මර්ලින් ප්‍රනාන්දු - බර්ට් ප්‍රනාන්දු යන දම්පතීන් ගේ පුතණු කෙනකුන් ලෙස 1935 ඔක්තෝම්බර්

30 දින මෙ ලොව එළිය දුටු නොයෙල් ප්‍රනාන්දු මහතා ගල්කිස්සේ සාන්ත තෝමස් විදුහලින් අධ්‍යාපනය ලැබ, පසු ව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නියමු නිලධරයකු ලෙස සේවයට බැඳුණේ ය. සිය දෙමවුපියන් ගේ ඇසුරින් ද, පාසල් අධ්‍යාපනයෙන් ද, දහම් පාසලින් ද ලද ශික්ෂණය එතුමා ගේ දිවි මඟ වඩාත් අර්ථවත් සේවා මං පෙතකට යොමු කළේ ය.

පවුලේ සොයුරු සොයුරියනට පිය සෙනෙහසින් දියුණුවේ මං පෙත පාද දුන් කලණ සොහොයුරකු වූ එතුමා ශිෂ්‍යාධාර සමිතිය නමින් සංවිධානයක් පිහිටුවා දරුවන් ගේ අධ්‍යාපන කටයුතු නංවාලීමට අපරිමිත මෙහෙයක් සිදු කළේ ය. ධර්මායතනයේ ඉගෙන ගන්නා කුඩා ස්වාමීන් වහන්සේලාට කාරුණික පියතුමකු වූ එතුමා පරමපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහ නා හිමිපාණන් වහන්සේටත් අතිපූජ්‍ය අම්පිටියේ ශ්‍රී රාහුල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේටත් ඉතා බැතිමත් කුලුපග දායක මහතෙක් විය.

සිරි වජිරාරාමයේ දියුණුව නතර ව තිබූ මෑත අවධියෙහි, දායක පක්ෂයෙන් මැදිහත් ව, මැදහත් ව, නිර්භය ව, සමතුලිත ව ගැටලු නිරාකරණය කරමින් වත්මන්හි එහි නව ප්‍රගතියක් ඇති කිරීමට මුල් වූයේ වින්ග් කමාන්ඩර් නොයෙල් ප්‍රනාන්දු මැතිතුමා ය. ප්‍රතාපවත් පෙනුමත්, පෞරුෂයත්, වෙලාවට වැඩ කිරීමේ ගුණයත්, අපක්ෂපාතිත්වයත්, එ මෙන් ඉංග්‍රීසි භාෂාවේ විධාන ශෛලිය හා කාරුණික හැසිරවීමත් කෝමළ සිංහල බසත් මිශ්‍රව උපයෝගී කර ගනිමින් දායක සභාවේ කටයුතු මැනැවින් හැසිරවූ එතුමා විහාරස්ථානයේ අඩු පාඩු සොයා බලමින් ඒවා සම්පූර්ණ කිරීම සඳහා සිය ධනය ද නොමසුරු ව පරිත්‍යාග කෙළේ ය.

සිය විශ්‍රාම ජීවිතය ස්වකීය සංචාරක සමාගම වෙනුවෙන් ද, රොටරි සමාජය ආදි සමාජ සේවා වෙනුවෙන් ද, ස්කොෂ්

ක්‍රීඩාවේ ප්‍රගමනය වෙනුවෙන් ද, ඒ හැමට වඩා ඉහත සඳහන් විහාරස්ථාන ඇසුරින් සම්බුද්ධ ශාසනයේ සමුන්නතිය සඳහා ද කැප කළ මේ ශ්‍රේෂ්ඨ පුරුෂයා, සිය බිරිඳ හයසින්ත් මහත්මනිය ගෙන් ද දියණිය ගෙන් ද වෙන් ව පසු ගිය ජනවාරි 26 ද දිවියෙන් සදහට ම සමු ගත්තේ ය.

වින්ග් කමාන්ඩර් නොයෙල් ප්‍රනාන්දු මැතිතුමාට අප හැම උතුම් නිවන් සුව පතනුයේ එතුමා පිළිබඳ කෘතවේදී ස්මරණ රැසක් පෙරටු ව තබා ගෙන ය.

*'බෞද්ධ ළමයා' සංස්කාරක*

................................

## නොමියෙන මතකයකි ඔබ

ආදරය කරුණාව පිරුණු සිනහව මුහුණ
එකසේ ම පතුරමින් සැම දෙනට
ඔබ විසුළ වදන් වැල්
ළගන්නා සුලු බසින්
රැව් නගයි අරම තුළ
ඔබේ පිය සටහන් ද
නොමැකේවි මතු දින ද
උතුම් මිනිසත් ගුණෙන්
පිරිපුන් ය ඔබ සිරිත
සැබැවින් ම ශ්‍රේෂ්ඨයි
සසුනටත් මෙ දැයටත්
කළ මෙහෙය අමර වේ
යළි යළිත් එනු මැනවි
අප වෙතට මතු මතුත්
රකින්නට බුදු සසුන
සිරිමතාණනි ඔබට
පතමු අම මහ නිවන

*පුෂ්පා ජයවර්ධන මහත්මනිය*